# සිංහල හා දෙමළ ඉතිහාස - III

සිංහලයන්ගේ ඉතිහාසයෙහි දළ සැකැස්මක් කලින් ලිපි දෙකෙන් ඉදිරිපත් කෙළෙමු. අවසන් වශයෙන් අප සඳහන් කෙළේ සිංහල බෞද්ධ සංස්කෘතියෙහි බුදුන් වහන්සේ දේශනාකළ ධර්මයට අමතරව තවත් දේ ද ඇති බව ය. මේ සංස්කෘතික පෙළ ගැස්ම සිංහල බුද්ධදහම ලෙස හැඳින්විය හැකි ය. අශෝක බුද්ධදහම සිංහල සංස්කෘතියට අවශෝෂණය වූයේ සිංහල බුද්ධදහම ලෙස ය. දරදඬු නීති පද්ධතියකට හෝ සගරජ හිමි නමකගේ ආධිපත්‍යයට හෝ යට නොවුණු සංස්කෘතියක් එසේ වීම පුදුමයක් නො වේ. ලංකාවේ සගරජ සංකල්පය අනුරාධපුර යුගයෙන් පසුව බිහිවූවකි. කෙසේ වෙතත් සිංහල බුද්ධදහමෙහි ඇති දේව ඇදහිලි (එවාට ඇදහිලි යැයි කියන්නේ නම්) හින්දු ආගමකින් එකතු වූ දෑ නොව සිංහලයන් හා ඔවුන්ගේ පුරෝගාමී ගෝත්‍රිකයන් අතර අවුරුදු දෙදහස් පන්සියකට ද වැඩි අතීතයක සිට පවතින දෑ ය. හින්දු ආගම ඇතිවූයේ ශංකරාචාර්යවරයාගෙන් පසුව හයවැනි සියවසෙන් පමණ පසුව ය. කතරගම මහසෙන් දෙවියන්ට හයවැනි සියවසට එහා යන ඉතිහාසයක් ඇති බව වංසකතාවලින් පැහැදිලි වෙයි.

ලංකාවේ දෙමළ ඉතිහාසයේ ආරම්භය කවදා සිදුවිණි ද? ඇතැමුන් සිතන්නේ එළාර රජු දවස ද මෙරට දෙමළ ජනයා සිටි බව ය. එහෙත් එළාර දෙමළ වන්නේ මහාවංසයෙහි එසේ සඳහන් වන බැවිනි. පස්වැනි සියවසෙන් පමණ පසුව සිංහලයන් විදේශික ආක්‍රමණිකයන්ට දෙමළ යැයි කීමට පුරුදු වී ඇති බව පැහැදිලි ය. රාජාවලියෙහි පෘතුගීසීන් හැඳින්වෙන්නේ ද දෙමළ ලෙස ය. එකල සිංහල බෞද්ධ සංස්කෘතියෙහි ආභාසය ලබා ඇති කාම්බෝජ වැසියෝ අදත් සතුරන්ට දෙමළ යැයි කියති. පස්වැනි සියවසෙන් ඉහත ජීවත් වූ එළාර රජු දෙමළ වී ඇත්තේ පස්වැනි සියවසෙන් පමණ පසුව ය. ඉන්පසුව සිදු වූ දක්ෂිණ භාරතීය ආක්‍රමණ සමග දෙමළ ජනයා මෙරටට පැමිණි බවට සැකයක් නැති වුව ද, ඔවුන් ස්ථිර ව මෙහි පදිංචි වූ බවට සාක්ෂි නැත. යාපනය විශ්වවිද්‍යාලයේ ඉතිහාසය පිළිබඳ පළමු මහාචාර්යවරයා වූ කාර්තිගේසු ඉන්ද්‍රපාල මහතාට අනුව දොළොස්වැනි සියවසට පෙර මෙරට ස්ථිර දෙමළ වාසස්ථාන තිබී නැත. එසේ නම් ඉන් පෙර සිට මෙරට සන්තතකික දෙමළ ඉතිහාසයක් පැවතීමට හැකියාවක් නැත.

දහතුන්වැනි සියවසේ පමණ යාපනයේ ආර්ය චක්‍රවර්තී රාජ්‍යයක් පිහිටුවා ඇත. ආර්ය චක්‍රවර්තීහු පළමුව මුහුදු කොල්ලකරුවෝ වූහ. සිංහල රජු කන්ද උඩරට සිට රාජ්‍යය විචාල හෙයින් ආර්ය චක්‍රවර්තීන්ට යාපනය අර්ධද්වීපයෙහි රාජ්‍යයක් පිහිටුවා ගැනීමට හැකි විය. මේ රාජ්‍යය කන්ද උඩරට සිංහල රජුගෙන් මුළුමනින් ම ස්වාධීන රාජ්‍යයක් නො වී ය. පසු කලෙක ක්වේරොස් කෝට්ටේ රජු ලංකාවේ අධිරාජයා ලෙස හඳුන්වා දී ඇත්තේ එකල ලංකාවේ තිබූ අනෙක් රාජ්‍ය කෝට්ටේ රාජ්‍යයෙන් මුළුමනින් ම ස්වාධීන නොවූ බව ඔහු තේරුම් ගත් බැවිනි. එහෙත් ඔහුගේ යුරෝපීය මනසට එක්සේසත් රාජ්‍යය යන සංකල්පය නොවැටහෙන්නක් වූ බැවින් ඔහු තම යුරෝපීය ආකෘතියෙහි කෝට්ටේ රජු අධිරාජයා ලෙස හැඳින්වී ය. මෙරට බටහිර අච්චුවේ බිහිවූ ඊනියා ඉතිහාසඥයෝ ඒ බව වටහා නොගෙන පෘතුගීසීන් පැමිණෙන විට යාපනයේ ස්වාධීන රාජ්‍යයක් තිබූ බව බක පාණ්ඩිත්‍යයෙන් ලොවට කියති. ආර්ය චක්‍රවර්ති රාජ්‍යය භාරතයේ තිබූ රාජ්‍ය මෙන් ම වාංශික රාජ්‍යයක් විය. රජු සහ ජනතාව අතර ගෝත්‍රික වශයෙන් සංස්කෘතික වශයෙන් හෝ වෙනත් ආකාරයකින් (එකල මේ කලාපයේ ජනවර්ගයකට හෝ ජාතියකට හෝ පැවතියේ සිංහල ජාතිය පමණකි. දෙමළ ආදී ජනවර්ග බ්‍රිතානීන්ගේ නිර්මාණ විය.) හෝ එකට එක අනුරූපිතයක් නො වී ය. ආර්ය චක්‍රවර්තීන් ද්‍රවිඩ යැයි කීමට සාධකයක් නැත. ඔවුන් කාලිංගයන් වූ බවට මතයක් වෙයි. ඒ කෙසේ වෙතත් එකල යාපනයේ බහුතර ජනකාය සිංහල යැයි කිව හැකි ය. එයට අමතරව එහි වෙලක්කාර ජනයා ද විසූහ. ඔවුහු සිංහල රජවරුන් මෙන් ම විදේශික ආක්‍රමණිකයන් විසින් ද මෙරටට ගෙනෙනු ලැබූ කුලී හේවායෝ වූහ. ඔවුහු බොහෝ විට කේරළ ප්‍රදේශයෙන් ගෙනෙනු ලැබූ මලයාලම් බස කතාකරන පිරිසක් වූහ.

එකල යාපනයේ දෙමළ ජනයා නොසිටි බවක් මෙයින් නො කියැවෙයි. එහෙත් එහි කැපී පෙනෙන දෙමළ සංස්කෘතියක් නොවූ බව පැහැදිලි ය. අවුරුදු හයසීයකින් එපිට දෙමළ සංස්කෘතියක් ගැන යාපනයෙන් මතු වී ඇති ඓතිහාසික හෝ පුරාවිද්‍යාත්මක හෝ සාධක කිසිවක් නැත. යාපනයේ නොතිබූ දෙමළ හින්දු සංස්කෘතියක් නැගෙනහිර පළාතේ ත්‍රිකුණාමලයේ හෝ වෙනත් තැනක හෝ තිබිය නො හැකි ය. කෝණේස්වරම් ආදී කෝවිල්වල අවුරුදු දහසක ඉතිහාසයක් ගැන කියන බොරු කතා යාපනයේ එවැනි ඉතිහාසයක් ගැන කීමට නැතිවීමෙන් ම නිෂ්ප්‍රභ වෙයි. (අප පියාගේ පරම්පරාවේ අය කෝණේස්වරම් කෝවිල අද තිබෙන තැන එදා තිබූ පන්සල දුටුවෝ වූහ.) යාපනයෙහි එකල තිබී ඇත්තේ සිංහල බෞද්ධ සංස්කෘතියකි. එහි බෞද්ධ බව නැතැයි කීමට නොහැකි දෙමළ ජාතිවාදීහු ඒ බෞද්ධකම

© Prof. Nalin De Silva

දෙමළ බෞද්ධකමක් ලෙස අර්ථකථනය කිරීමට උත්සාහ කරති. මෙය ව්‍යාජයක් බව පැහැදිලි වන්නේ යාපනයේ එකල තිබූ දෙමළ බෞද්ධ සංස්කෘතියක් ගැන කියන අතර ම ඒ කාලයේ හෝ ඊටත් පෙර හෝ ත්‍රිකුණාමලය ආදී අනෙක් ප්‍රදේශවල තිබූ දෙමළ හින්දු සංස්කෘතියක් ගැන බොරු කීමට දෙමළ ජාතිවාදීන්ට සිදු වී ඇති බැවින් ය. මොවුන් කියන්නේ එකල යාපනයේ දෙමළ බෞද්ධයන් සිටි අතර අනෙක් ප්‍රදේශවල දෙමළ හින්දූන් සිටි බව ද? යාපනයේ දෙමළ ජනයා බෞද්ධ වීමට තිබූ විශේෂ සාධකය කුමක් ද? දක්ෂිණ භාරතයේවත් දෙමළ බෞද්ධයන් නොසිටි බව වරුණ චන්ද්‍රකිර්ති මහතා පෙන්වා දෙයි. (කාලය ජාල අඩවිය බලන්න). දෙමළ බෞද්ධයා යනු මුසාවාදයක් පමණ ය.

අවුරුදු දහස් ගණනක් මෙරට දෙමළ සංස්කෘතියක් තිබුණි නම් ඒ කාලයෙහි මෙරට ලියැවුණු දෙමළ පොතපත කවරේ ද? දක්ෂිණ භාරතයේ ලියූ දෙමළ පොත් මෙරට අවුරුදු දහස් ගණනක් තිස්සේ දෙමළ සංස්කෘතියක් තිබූ බවට සාධක නො වේ. එසේ නම් එංගලන්තයේ ලියූ ඉංගිරිසි පොත් සාධක ලෙස ගනිමින් ෂේක්ස්පියර් යුගයේ ද ඇමරිකාවේ ඉංගිරිසි කතාකරන ජනයා සිටි බවට ඇමරිකානුවන්ට තර්ක කළ හැකි ය. ආර්ය චක්‍රවර්තීන් මෙරටට එන සමයෙහි යාපන අර්ධද්වීපයේ පමණක් දෙමළ ජනයා සුළුතරයක් සිටි බවට සාක්ෂි ඇත. ආර්ය චක්‍රවර්ති රජු සෑම වසරක ම හම්පොළට හෝ වෙනත් තැනකට හෝ ගොස් තමාට රජ යන පදවි නාමය භාවිතා කිරීමට සිංහලේ රජුගෙන් අවසර ගැනීමේ සම්ප්‍රදායක් පැවතී ඇත. එසේ ගිය එක් අවස්ථාවක දී ආර්ය චක්‍රවර්ති රජු දෙමළ කාන්තාවකින් ලද සංකිලි නම් තැනැත්තෙක් බලහත්කාරයෙන් යාපනයේ රජු බවට පත්විය. මොහුගෙන් පසු යාපනයේ රජවරු දෙමළ වූහ. සංකිලි පෘතුගීසීන්ට විරුද්ධව කළ සටන්වල දී සිංහල රජුගේ සහාය ද ඔහුට ලැබිණි. පසු කලෙක පෘතුගීසීන් දෙමළ හින්දු (එහි දී ද දෙමළ බෞද්ධ කමක් ගැන නො කියැවෙයි) ජනයා කතෝලික ආගමට හැරවීම හේතුකොටගෙන සංකිලි එසේ කතෝලික වූ ජනයා මරා දැමුවේ ය. ඔහු මරා දැම්මේ දෙමළ කතෝලිකයන් පමණක් නො වේ. සිංහල බෞද්ධයන් ද දහස් ගණනින් මරා දැම්මේ ය. එහෙත් ඔහුට සිංහලයන් මුළුමනින් ම නැතිකිරීමට නො හැකි විය.

දහහත්වැනි සියවසෙහි ලන්දේසීන් මෙරටට පැමිණි පසු භෝග වගාවක් ලෙස දුම්කොළ වගාකෙරිණි. ඒ සඳහා දක්ෂිණ භාරතයේ කෝරමණ්ඩල් වෙරළින් කෘෂිකාර්මික කම්කරුවෝ ගෙනෙනු ලැබූහ. මොවුන්ගෙන් ඇතැමකු ගෙනෙනු ලැබුයේ වහලුන් ලෙස ය. ලන්දේසිහු මෙසේ දෙමළ කතාකරන්නන් දකුණු අප්‍රිකාවේ නැටෝල් ප්‍රදේශයට ද ගෙනගියහ. එහි ද කෘෂිකාර්මික කම්කරුවන් ලෙස හැඳින්වෙන වෙල්ලාලයෝ වෙති. ලංකාවට ගෙනෙනු ලැබූ කම්කරුවෝ අස්වැන්න නෙළීමෙන් පසු තම නිජභූමිය වූ දක්ෂිණ භාරතයට ගියහ. ඒ නැවැත්වීමට 1707 දී ලන්දේසීහු මුස්ලිම් නීතියක් වූ තේසවළාමෙයි සංග්‍රහ කළහ. කෙසේ වෙතත් ටික කලෙකින් වෙල්ලාලයෝ යාපන අර්ධද්වීපයෙහි බහුතර ජනකොටස බවට පත්වූහ. ඔවුහු එහි ප්‍රධාන කුලය බවට පත්වී කෘෂිකාර්මික කම්කරු තනතුරින් ගොවියන් බවට පත්වූහ. එතෙක් එහි සිටි සිංහල ගොවියන් කෝවියාර් නමින් ඊනියා අඩුකුලයක් බවට පත්කෙරිණි. වෙනත් රැකියාවල නිරතව සිටි සිංහලයන්ගෙන් නලවාර් වැනි කුල නිර්මාණය කෙරිණි. යාපනයේ සිදු වී ඇත්තේ එතෙක් වෙල්ලාලයන් තමන් එහි ගෙනෙන විට තිබූ දෙමළ හෝ වෙනත් හෝ සංස්කෘතියක ගිලා බැසීම නොව සංඛ්‍යාවෙන් වැඩිවීම හේතුවෙන් එහි සිටි අනෙක් ජනයා තම සංස්කෘතික ආධිපත්‍යය යටතට ගැනීම ය. යම් අයුරකින් වෙල්ලායන් තමන් පැමිණි කල යාපනයේ තිබූ දෙමළ සංස්කෘතියක ගිලා බැස්සේ නම් අපට අතීතයේ සිට එන දෙමළ ඉතිහාසයක් (රාජ්‍යයක් නැතත්) ගැන කතාකිරීමට තිබිණි. එහෙත් එවැන්නක් වෙනුවට සිදු වී ඇත්තේ වෙල්ලාලයන් අධිපතියන් බවට පත්වී එතෙක් එහි සිටි සිංහලයන්, මලයාලම් කතාකළ වේලක්කාරයන් ආදීන් දෙමළකරණයකට ලක්කර අනෙක් සුළුතර දෙමළ ජනයා ද සමගින් තම සංස්කෘතික ආධිපත්‍යය යටතට ගැනීම ය. අද උතුරේ සිටින දෙමළ ජනයා ඒ අයගෙන් පැවතෙන්නෝ වෙති. එබැවින් උතුරේ වත්මන් දෙමළ ජනයාගේ, දෙමළ සංස්කෘතියේ හා දෙමළ ඉතිහාසයේ සම්භවය 1650න් ඔබ්බට නො යයි. භාරතයේ මෙන් බ්‍රාහ්මණ කුලය යාපනයෙහි අධිපතිවාදී කුලය නො වෙයි. දෙමළ ජනයා ඈත අතීතයේ සිට පැවතෙන්නේ නම් යාපනයේ ද ප්‍රධාන කුලය බ්‍රාහ්මණ විය යුතු ය. එහෙත් වෙල්ලාලයන් එහි අධිපති වූයේ ලන්දේසීන් නිසා ය. ලන්දේසීන්ට අවශ්‍ය වූයේ කම්කරුවන් මිස හින්දු පූජකයන් නො වේ. යාපනයේ ආඩියා ළිඳ ද ගෙනෙනු ලැබුයේ වෙල්ලාලයන් විසිනි. මේ සියල්ලටත් වඩා යාපනයේ කතාකරන දෙමළ හා පොදුවේ තමිල්නාඩුවේ කතාකරන දෙමළ අතර වෙනස අවුරුදු තුන්සිය පනහකට වැඩි නො වේ. මඩකලපුවේ හා කඳුකරයේ දෙමළ ඉතිහාසය යාපනයේ දෙමළ ඉතිහාසයටත් වඩා මෑතක ඉංගිරිසීන් නිසා ඇරඹී ඇත.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva